ඉන්දියානු සම්භවයක් ඇති ඇනකාඩියේසි කුලයට අයත් අඹ (*Mangifera indica*) අප රටට ආවේනික ගසක් නොවුවද, ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශයන් හි දක්නට ලැබේ. උඩරට ප්‍රදේශ කිපයක හැර ලංකාවේ අනෙකුත් සෑම ප්‍රදේශයකම පාහේ අඹ ගසක් නොමැති ගෙවත්තක් නොමැති තරම් වේ. කෙසේ වුවද, ලංකාවේ ප්‍රධාන වශයෙන් අඹ වගා කරනු ලබන්නේ කුරුණෑගල, අනුරාධපුර, හම්බන්තොට, පුත්තලම, මහවැලි එච් සහ සී කලාප, මොණරාගල, යාපනය, මාතලේ වැනි දිස්ත්‍රික්කයන්හිය.

**දේශගුණික අවශ්‍යතා**

නිවර්තන සහ උප නිවර්තන දේශගුණික තත්ත්වයන්ට අනුවර්තනය වී ඇති අඹ මුහුදු මට්ටමේ සිට මීටර් 1300 පමණ උස් වූ ප්‍රදේශයන් හි වගා කළ හැකිය. නමුත් වාණිජ මට්ටමේ වගාවන් සඳහා සුදුසු වන්නේ මුහුදු මට්ටමේ සිට උස මීටර් 600 ට වඩා අඩු ප්‍රදේශ පමණකි. අඹ වගාව සඳහා ප්‍රශස්ථ උෂ්ණත්වය සෙන්ටිග්‍රේට් අංශක 27-30 පමණ වේ. වාර්ෂික වර්ෂාපතනය මි.මි. 500-2500 ක් පමණ විශාල පරතරයක් පවතින ප්‍රදේශයන්හි මෙම බෝගය වගා කළ හැකිය. නමුත් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීම සඳහා වැදගත් වන්නේ ලැබෙන සම්පූර්ණ වර්ෂාපතන ප්‍රමාණය නොව එහි ව්‍යාප්තියයි.

අඹ ගසක හොඳින් මල් හට ගැනීම සඳහා මාස 3-4 පමණ වියළි කාලයක් තිබීම වැදගත්ය. එසේම මල් හටගන්නා අවස්ථාවේදී වර්ෂාව ලැබීම නිසා පරාගණය දුර්වල වී හට ගන්නා ගෙඩි සංඛ්‍යාව අඩුවිය හැකිය.

**සුදුසු ප්‍රභේද**

වියළි කලාපය සඳහා කර්තකොලොම්බන්, විලාඩ්, මල්වාන, ටොම් EJC වඩා සුදුසු වේ. අතරමැදි කලාපය සඳහා කර්තකොලොම්බන්, වෙල්ලෙයිකොලොම්බන්, විලාඩ්, පෙට්ටි අඹ, මල්වාන ටොම් EJC වඩා සුදුසු වේ. තෙත් කලාපය සඳහා වෙල්ලෙයිකොලොම්බන්, ගිරා අඹ, පීටර් පසාන්ඩ්, දම්පර වැනි ප්‍රභේද සුදුසු වේ.

**පස**

මීටර් 2ක් පමණ ගැඹුරු බොරළු සහිත පස වඩාත් සුදුසු වේ. පී.එච්. අගය 5.5-7.5 අතර විය යුතුය.

**බිම් සැකසීම**

ජලවහනය හොඳින් සිදුවන භූමියක් තෝරා ගත යුතුය. ගැඹුරට සීසා කැට පොඩිකර සුදුසු පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කල යුතුය.

**පරතරය**

ප්‍රභේදය සහ වගා ක්‍රමය අනුව පරතර වෙනස් වේ. විලාඩ් සඳහා මීටර් 7×10 ද සෙසු ප්‍රභේද සඳහා මීටර් 10×10 ද සාමාන්‍යයෙන් යොදා ගැනේ. මීටර් 3ක් පමණ උසට ගසේ උස පාලනය කරන වගා ක්‍රමයේදී මීටර් 6×6 පරතර සුදුසු වේ.

**සිටුවීම**

සැහැල්ලු පසක් නම් සෙ.මී. 60×60×60 ප්‍රමාණයේ වලක් ද මැටි සහිත හෝ ගල් බොරළු අධික පසක් නම් සෙ.මී. 90×90×90 ප්‍රමාණයේ වලක්ද සකසා ගන්න. පැළ සිටුවීමට සති 2කට පමණ පෙර, දිරාපත් වූ කාබනික පොහොර සමග මතුපිට පස් හොඳින් කලවම් කර පොළව මට්ටමින් තරමක් ඉහලට පස් මුදුන් වන සේ පුරවා ගන්න.

සිටුවීමට වඩාත් සුදුසු වන්නේ බද්ධ පැළ වේ. වියළි කලාපයේ මාස් කන්නයේ වර්ෂාව ආරම්භවීමත් සමග පැල සිටුවීමත් තෙත් හා අතරමැදි කලාපවල යල හා මහ කන්න වැසි ආරම්භවීමත් සමග සිටුවීමත් වඩා සුදුසු වේ. ගෙවතු වගාවේදී තද වැසි කාලය මග හැර වසරේ ඕනෑම කාලයක සිටුවා අවශ්‍ය විට ජල සම්පාදනය කල හැක.

විශේෂයෙන් බද්ධ පැළ සිටුවීමෙන් අනතුරුව ආධාරකයක් සිටුවා සෙවන කිරීමෙන් පැළයට ආරක්ෂාව සැපයීම අවශ්‍ය වේ.

**ගස් පුහුණු කිරීම**

පැළ අවධියේ සිටම නිසි පරිදි ගස් පුහුණු කිරීම මගින් ඵලදායිතාව වැඩිකර ගත හැක. එහිදී අවශ්‍ය ප්‍රමාණයට ශක්තිමත්/හොඳ සැකිල්ලක් සහිත ඵල දරණ රිකිලි වැඩි ප්‍රමාණයක් හා උසස් ගුණාත්මයෙන් වැඩි ඵලදාවක් නිරන්තරව ලැබෙන ගසක් ලබාගත හැක. මුදුන් අතු හරස් අතු නිසි ආකාරව සකස් කර ගත යුතුයි. එය මැද විවෘත ක්‍රමයට (Center Open System) පුහුණු කිරීමෙන් කළ හැක. එහිදී මීටර් 1 උසින් අග්‍රස්ථය ඉවත් කරයි. ගස වටේට සමබරව අතු විහිදෙන ලෙස අතු දෙකක් අතර පරතරය සෙ.මී. 20ක් පමණ වන පරිදි රාමුව සකස් කරයි. දිය රිකිලි මාස 2-3කට වරක් ගසට සමීපව කපා දමයි. (තුවාලය පොත්තෙන් වැසියයි) ගස් දෙකක් අතර පරතරයෙන් අඩක් දක්වා අතු විහිදීමට සලස්වයි. සෑම අවස්ථාවකම මැද විවෘතව පවත්වා ගනී.

සෑම අස්වනු නෙලීමකින්ම පසුව ගස් කප්පාදු කළ යුතුය. එහිදී දිය රිකිලි, මැරී ගිය අතු, එකිනෙක හරහා යන අතු, රෝග පලිබෝධ ආසාදිත අතු ඉවත්කර පුළුස්සා දමයි.

**මල් පිපීම**

වර්ධක වර්ධනය පාලනය කර මල් පිපීම උත්තේජනය කිරීමට පොතු වලලු ඉවත් කිරීම කළ හැක. සෙ.මී. 0.5 සිට 2 පමණ පළලට (කඳේ මහත අනුව වෙනස් වේ) හා ලිය දක්වා ගැඹුරට අර්ධ වලලු දෙකක් ලෙස ප්‍රධාන කඳේ හෝ අතුවල හෝ පොත්ත ඉවත් කිරීම කළ යුතුය. වසර 3-4 කට වරක් අතු කප්පාදුවට පසු පොතු වලලු ඉවත් කිරීම කළ හැක. මල් පිපීම උත්තේජනයට රසායනික ද්‍රව්‍ය ලෙස පැක්ලොබියුට්‍රසෝල් (Paclobutrazol) වැනි හෝමෝන ගස මුලට යෙදීම කළ හැක. මල් පිපීම සාමාන්‍යයෙන් පෙබරවාරි හා සැප්තැම්බර් මාස වල සිදුවේ. ඉහත හෝමෝන යෙදීම මල් පිපීමට දින 45 කට පමණ පෙරාතුව කළ යුතුය.

නියමිත මිශ්‍රණය තෙත් කළ පසේ ගස පාමුලට යෙදිය යුතුය.

**වල් පැළෑටි පාලනය**

වැදගත් වන්නේ ගස පාමුල අවට ප්‍රදේශයේ වල් පැළෑටි පාලනය කිරීමයි.

**පොහොර යෙදීම**

| **වියලි හා අතරමැදි කලාපය ගසකට ග්‍රෑම්** | **යූරියා** | **ත්‍රි.සු පො.** | **මි.ඕ. පො** |
|---|---|---|---|
| මුලික පොහොර | 160 | 200 | 90 |
| 1වන වසර මාස 4කට වරක් | 55 | 65 | 30 |
| 2වන වසර මාස 4කට වරක් | 80 | 100 | 45 |
| 3වන වසර මාස 4කට වරක් | 110 | 135 | 60 |
| 4වන වසර මාස 4කට වරක් | 135 | 165 | 75 |
| 5වන වසර මාස 4කට වරක් | 160 | 200 | 90 |
| **ඵල දරණ ගස් සඳහා** | | | |
| 1වන වසර අස්වනු නෙලීමෙන් පසු | 180 | 80 | 250 |
| මල් පිපෙන අවස්ථාවේ | 60 | 80 | 250 |
| 2වන වසර අස්වනු නෙලීමෙන් පසු | 270 | 120 | 350 |
| මල් පිපෙන අවස්ථාවේ | 90 | 120 | 350 |
| 3වන වසර අස්වනු නෙලීමෙන් පසු | 360 | 160 | 450 |
| මල් පිපෙන අවස්ථාවේ | 20 | 160 | 450 |
| 4වන වසර අස්වනු නෙලීමෙන් පසු | 450 | 200 | 550 |
| මල් පිපෙන අවස්ථාවේ | 150 | 200 | 550 |
| 5වන වසර අස්වනු නෙලීමෙන් පසු | 540 | 240 | 650 |
| මල් පිපෙන අවස්ථාවේ | 180 | 240 | 650 |
| 6වන වසර අස්වනු නෙලීමෙන් පසු | 630 | 280 | 750 |
| මල් පිපෙන අවස්ථාවේ | 210 | 280 | 750 |
| 7වන වසර සහ ඉන් පසු අස්වනු නෙලීමෙන් පසු | 720 | 320 | 850 |
| මල් පිපෙන අවස්ථාවේ | 240 | 320 | 850 |

| තෙත් කලාපය ගසකට ග්‍රෑම් | යූරියා | රොක් පො. | මි.ඔ. පො. |
|---|---|---|---|
| මූලික පොහොර | 115 | 230 | 105 |
| 1වන වසර මාස 4කට වරක් | 40 | 75 | 35 |
| 2වන වසර මාස 4කට වරක් | 60 | 115 | 55 |
| 3වන වසර මාස 4කට වරක් | 130 | 155 | 70 |
| 4වන වසර මාස 4කට වරක් | 155 | 190 | 90 |
| 5වන වසර මාස 4කට වරක් | 180 | 230 | 105 |
| **ඵල දරණ ගස් සඳහා** | | | |
| 1වන වසර අස්වනු නෙලීමෙන් පසු | 165 | 162 | 190 |
| මල් පිපෙන අවස්ථාවේ | 55 | 162 | 190 |
| 2වන වසර අස්වනු නෙලීමෙන් පසු | 248 | 245 | 285 |
| මල් පිපෙන අවස්ථාවේ | 82 | 245 | 285 |
| 3වන වසර අස්වනු නෙලීමෙන් පසු | 330 | 327 | 380 |
| මල් පිපෙන අවස්ථාවේ | 110 | 327 | 380 |
| 4වන වසර අස්වනු නෙලීමෙන් පසු | 413 | 410 | 475 |
| මල් පිපෙන අවස්ථාවේ | 137 | 410 | 475 |
| 5වන වසර අස්වනු නෙලීමෙන් පසු | 495 | 492 | 570 |
| මල් පිපෙන අවස්ථාවේ | 165 | 492 | 570 |
| 6වන වසර අස්වනු නෙලීමෙන් පසු | 578 | 575 | 665 |
| මල් පිපෙන අවස්ථාවේ | 192 | 575 | 665 |
| 7වන වසර සහ ඉන් පසු අස්වනු නෙලීමෙන් පසු | 660 | 657 | 760 |
| මල් පිපෙන අවස්ථාවේ | 220 | 657 | 760 |

* ත්‍රි.සු.පො. - ත්‍රිපල් සුපර් පොස්පේට්

** රොක්. පො. - රොක් පොස්පේට්

*** මි.ඔ.පො. -මියුරියේට් ඔෆ් පොටෑෂ්

**පොහොර යෙදීම පසේ තෙතමනය ඇති විටදී සිදුකල යුතුය.**

**ජල සම්පාදනය**

මුල් වසර 3 තුල දිගු වියළි කාලගුණයක් පවති නම් ජල සම්පාදනය වැදගත් වේ. පත්‍ර මේරීමෙන් පසුව මල් හටගන්නා තෙක් ජල සම්පාදනය නොකල යුතුය. ඉන් පසුව ඵල මේරීම දක්වා නිසි පරිදි තෙමනය තිබීම වැදගත් වේ.

**රෝග පාලනය**

**ඇන්ත්‍රැක්නෝස් රෝගය**

දිලීරයක් නිසා ඇති වේ. පැළ තවාන්වල නිතර දැකිය හැකි අතර මල්වලට වැළදුනු විට මල් දුඹුරු පැහැ වී වියළී යයි. පාලනයට ගස තුලට හොඳින් හිරු එළිය වැටීමට සලස්වන්න. මල් හට ගැනීම ආසන්න අවස්ථාවේදීත් මල් හටගත් පසුවත් මැන්කොසෙබ්. ඩැකොනිල්. මැනෙබ් වැනි දිලීර නාශකයක් ඉසීම කළ හැක.

**ඵල අග කුණුවීම**

දිලීරයක් නිසා ඇති වේ. නෙලාගත් ගෙඩියේ නටුව අවට ප්‍රදේශයේ රෝග ලක්ෂණ ඇතිවිය හැක. දුඹුරු පැහැති පැල්ලම් ඇති වී කුණුවීමට ලක් වේ. පාලනයට මල් පිපෙන අවධියේදී හා ගෙඩි වැඩෙන විට මැන්කොසෙබ්. ටොප්සින් වැනි දිලීර නාශක ඉසීම කළ හැක.

**පලිබෝධ පාලනය**

**අඹ කීඩෑවා**

දළු සහ මල් වල යුෂ උරාබීම නිසා වියලීමට ලක්වේ. අස්වැන්නද විශාල වශයෙන් අඩු වේ. පාලනයට ගස තුලට හොඳින් හිරුඑළිය ලැබීමට සැලැස්වීම, මල් හා දළු හටගන්නා අවධියේදී ඉමිඩක්ලෝප්‍රිඩ්. ඩයිමෙතොඒට් වැනි කෘමි නාශකයක් ඉසීම කල හැක.

**පලතුරු මැස්සා**

ගැහැණු සතා ඵල විද බිත්තර දමයි. ඉන් ඇතිවන කීටයන් ගෙඩියේ මාංසලය ආහාරයට ගනී. පාලනයට ගස යට වැටී ඇති හානියට ලක් වූ ගෙඩි එකතු කර විනාශ කිරීම. මිතයිල් ඉයුජිනෝල් අඩංගු උගුල් භාවිතා කිරීම. ඵල ආවරණය කිරීම කළ හැක.

**අස්වැන්න**

සිටුවා වසර 3-4 කින් පලමු අස්වැන්න ලබාගත හැක. හොඳින් මෝරා ඇති ගෙඩි පෙ.ව. 9.00ත් ප.ව. 3.00ත් අතර කාලයේදී නෙලා ගැනීම වඩාත් සුදුසු වේ. වැසි කාලගුණය යටතේ අස්වනු නෙලීමෙන් වලකින්න. ගසකින් ලබාගත හැකි ගෙඩි ගණන අවු 5 සිට 25 දක්වා 450 සිට 1250 ක් පමණ වේ. හොඳින් මේරූ ගෙඩි ජලයේ පාවේ.

වැඩි විස්තර සඳහා
අධ්‍යක්ෂ
ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
මහඉලුප්පල්ලම

දුරකථන: 025-2249177 ෆැක්ස්:- 025-2244132

**2007 ගොවි සතිය සඳහා සකස් කරන ලදී**

Designed by : AUDIO VISUAL CENTRE Department of Agriculture Peradeniya
Printed by : AGRICULTURE PRESS Gannoruwa

# අඹ වගාව



**ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය**
**මහඉලුප්පල්ලම**